1980 දශකය බන්දුල වර්ණපුරගේ වර්ණවත් දශකය බවට පත්වූ අතර ක්‍රීඩා ලෝලීන් අතර පමණක් නොව පාසල් ක්‍රිකට් ක්‍රීඩකයන් අතර පවා ජනප්‍රිය ම ක්‍රීඩකයා ඔහු විය. කලක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නිල ඡායාරූප ශිල්පියා ලෙස කටයුතු කළ දෙටු ප්‍රවීණ ඡායාරූප මාධ්‍යවේදී ප්‍රසන්න හෙන්නායක බන්දුල වර්ණපුරගේ සමීප මිතුරෙකි; රසිකයෙකි. බදුල්ලේ පාසලකින් ශිෂ්‍යත්ව විභාගය සමත් වූ ඔහුට කොළඹ ආනන්ද, නාලන්ද සහ රාජකීය යන විද්‍යාල තුනෙන් එකකට ඇතුළත් වීමට ලැබුණු අවස්ථාවේදී ඔහු නාලන්දා විද්‍යාලය තෝරා ගන්නේ බන්දුල වර්ණපුර ඔහු අතිශයින් ඇලුම් කළ ක්‍රිකට් ක්‍රීඩකයාගේ පාසල නාලන්දාව වූ නිසාය. වැඩිමහල් සහෝදරයකු සහ සමීපතම මිතුරකු සේ තමාට ළෙන්ගතුව සිටි බන්දුල වර්ණපුර ගැන ප්‍රසන්න හෙන්නායකගේ සිතේ ඇත්තේ සොඳුරු මතක සමුදායකි.

"ඒ කාලේ මම ඇතුළු පාසල් ක්‍රීඩකයන් බන්දුල වර්ණපුර ක්‍රීඩා කරන එක තරගයක්වත් නොබලා අතෑරියේ නැහැ. බන්දුල වැඩිපුරම ජනප්‍රිය වුණේ 1972 ආනන්ද- නාලන්ද බිග්මැච් එකේදී ලකුණු 118ක් නොදැවී ක්‍රීඩා කරමින් පී. එම්. ජයතිලක ක්‍රීඩකයා ලකුණු 111ක් ලබාගනිමින් ඊට අවුරුදු 44කට කලින් තැබූ වාර්තාවක් බිඳ හෙළීම නිසයි. එදා අපි බන්දුලව කරේ තියාගෙන ග්‍රවුන්ඩ් එක වටේ ගියා. නාලන්දා විද්‍යාලයේ ක්‍රිකට්වල ස්වර්ණමය යුගය තිබුණේ ගුණපාල වික්‍රමරත්න, සුමනදාස අතුකෝරල කියන විදුහල්පතිවරුන් යටතේ. ජෙරී ගුණරත්න, නෙල්සන් මෙන්ඩිස්, ප්‍රේමසර ඈපාසිංහ , ලයනල් මෙන්ඩිස් වැනි ක්‍රීඩා ගුරුවරු සහ පුහුණුකරුවන් ඒ තත්ත්වය ඇතිකරන්න විශාල පිටිවහලක් වුණා. බන්දුල විවාහ වුණේ ඔහුගේ මිතුරෙක්ගේ සහෝදරියක් වූ හේමමාලි අරඹෙවෙල සමඟ. මධුර, මාධව, ගීතානි ඔවුන්ගේ දූ දරුවන්. බන්දුලගේ පුතුන් දෙදෙනාම නාලන්දා ක්‍රිකට් කණ්ඩායමට ක්‍රීඩා කළා. එක පුතෙක් හරි ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරනවා දකින්න බන්දුගේ හිතේ ලොකු ආශාවක් තිබුණත් යම් යම් හේතු මත එය ඉටුවුණේ නැහැ. දකුණු අප්‍රිකානු සංචාරය සම්බන්ධ සිදුවීමෙන් පසු ඔහු ක්‍රිකට් පරිපාලනයට යොමුවුණා. ආසියානු ක්‍රිකට් කවුන්සලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සිටියදී ඔහු බොහෝ රටවල ක්‍රිකට් ආරම්භ කළා. ඇෆ්ගනිස්ථානය එවැනි එක් රටක්. බන්දුල ක්‍රිකට් නිසා මුදල් ඉපයුවේ නැහැ. ඔහු ඉපැයුවේ මිනිස්සු. බ්ලූම්ෆීල්ඩ් ක්ලබ් එකේ මැච් බලන්න ඒ දවස්වල වැඩිපුර ආවේ ඉහළ පැළැන්තියේ අය නෙවෙයි. සාමාන්‍ය පන්තියේ මිනිස්සු. බන්දුල කියන්නේ දුප්පත් මිනිස්සුන්ගේ මනුස්සයෙක්."

හිටපු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයන් වන දුලිප් මෙන්ඩිස්, අජිත් ද සිල්වා ඇතුළු බන්දුල වර්ණපුරගේ සමකාලීන ක්‍රිකට් සගයන් සියලුදෙනාම ඔහුගේ වියෝවෙන් දැඩි කම්පාවට පත්ව සිටී. හිටපු ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩක සිදත් වෙත්තමුණිට ද බන්දුල වර්ණපුර ගැන මතක බොහෝය.

"1977 ටෝනි ග්‍රෙග් ලංකාවට ආව වෙලාවේ ගුවන්විදුලි වැඩසටහනකට සහභාගි වෙමින් කියලා තිබුණා සුනිල් ගවස්කාර්ට පස්සේ ඉන්දියාව, ලංකාව කියන රටවල් දෙකෙන්ම දැකපු හොඳම පිතිකරු බන්දුල වර්ණපුර කියලා. බන්දුල දක්ෂ ක්‍රීඩකයෙක්. මම ඔහුගෙන් දැකපු විශේෂම දේ ඔහු අලුත් ක්‍රීඩකයන්ව හොඳින් බලාගත්තා, ඔවුන්ව ආරක්ෂා කළා. කාටවත් අනවශ්‍ය පීඩනයක් දෙන්නෙ නැතිව හැමදේම හරියට සැලසුම් කළා."

හිටපු වේග පන්දු පුහුණුකරුවකු වන අනූෂ සමරනායක පැවසුවේ දක්ෂ ක්‍රිකට් පරිපාලකයකු වූ බන්දුල වර්ණපුර වියෝ වීමේ ප්‍රබල පාඩුව සිදු වූයේ මෙරට ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගතයට බවය.

"මට මතකයි නුවර ක්‍රීඩාංගණය හදන දවස්වල හෝටලයක ඉන්න පුළුවන්කම තියෙද්දි බන්දුල කන්ටේනර් පෙට්ටියක් ඒ. සී කරගෙන ඒකේ තමයි ක්‍රීඩාංගණය හදලා ඉවර වෙනකම්ම නතරවෙලා හිටියෙ. ඒ තරම් කැපවීමක්, ආදරයක් ලංකාවේ ක්‍රිකට් වෙනුවෙන් ඔහුගේ හිතේ තිබුණා."

බන්දුල වර්ණපුර මෙරට ක්‍රිකට් ඉතිහාසය තුළ නොමැකෙන චරිතයක් බවට පත්වුවද ඔහු ක්‍රීඩා කළ ටෙස්ට් තරග සංඛ්‍යාව 4ක් සහ එක්දින තරග සංඛ්‍යාව 12කට සීමා විය. 1983 වසරේදී ආන්දෝලනාත්මක දකුණු අප්‍රිකානු සංචාරයට එක්වීම හේතුවෙන් බන්දුල වර්ණපුර ඇතුළු ක්‍රීඩකයන්ට වසර 25ක තරග තහනමක් පැනවුණු අතර වසර කිහිපයකට පසුව එම තහනම ඉවත් විය. එසේ වුවද එම සිදුවීමෙන් පසු මෙම පෙරළිකාර ක්‍රීඩකයාගේ ක්‍රීඩා දිවිය වෙනස් මාවතකට යොමු විය. බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා සමාජය තුළින් ක්‍රිකට් පරිපාලනයට එක්වූ බන්දුල වර්ණපුර ජීවිත ගමන නිමාකරන විටද එහි සභාපතිවරයා ලෙස කටයුතු කරමින් සිටියේය. හිටපු විශිෂ්ට පිතිකරුවකු සහ පන්දු රකින්නකු වූ රොෂාන් මහනාම උප සභාපති ලෙස කටයුතු කළේය. බන්දුල වර්ණපුර මෙන්ම රොෂාන් මහානාම ද ආදි නාලන්දියකු වන අතර ඊටත් වඩා සුවිශේෂී සම්බන්ධයක් බන්දුල සහ රොෂාන්ගේ ක්‍රිකට් මතක අතර වේ. 1972 වසරේ පැවති ආනන්ද - නාලන්ද සුලෝහිත සංග්‍රාම ඉතිහාසයේ ඉහළම ලකුණු ලාභියා බවට පත්වෙමින් ලකුණු 118ක් රැස් කරමින් බන්දුල වර්ණපුර තැබූ වාර්තාව ඉන් වසර 12කට පසු බිඳ දමනු ලැබුවේ රොෂාන් මහනාම ය.

"මගේ ක්‍රිකට් ජීවිතය ආරම්භයේ සිටම බන්දුල අයියා මට විශාල ආශිර්වාදයක් වුණා. විවිධ අභියෝග නිසා ක්‍රීඩාව අතහැර යෑමට සිතමින් සිටි අවස්ථාවල ඔහු මට බොහෝ මඟපෙන්වීම් කළා. තරුණ ක්‍රීඩකයකු වූ මට බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා සමාජයට ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබාදුන්නා වගේම තරග තීරකවරයකු ලෙස අයි.සී.සී යට අපේක්ෂකයෙකු ලෙස මගේ නම ඉදිරිපත් කිරීමටත් ඔහු මූලික වුණා."

රොෂාන් මහානාම තම ආදරණීය ජ්‍යෙෂ්ඨයාගේ මතක සිහි කළේ කෘතවේදීවය. ජීවිත තණතිල්ලේ අවසන් ඉනිම සනිටුහන් කොට දැයෙන් සමුගත් බන්දුල වර්ණපුර ගැන කිව යුතු දේ බොහෝ වුවත්,

ප්‍රේමසර ඈපාසිංහ ඉංග්‍රීසි බසින් පැවසූ කවියක සිංහල අරුතැති වදන් පෙළකින් මෙම සටහන අවසන් කරමි.

"ලකුණු දමන පුද්ගලයා පැමිණ ඔහුගේ නම ඉදිරියේ ලකුණු සටහන් කරන විට වැදගත් වන්නේ ඔහු දිනුවාද පැරදුණා ද යන්න නොව ඔහු මහත්මයකු ලෙස තරගවල යෙදුණාද යන්නයි"

බන්දුල වර්ණපුර ඒ වදන් පෙළට සාධාරණයක් ඉටු කළ බව ඔහුගේ වියෝව වෙනුවෙන් තැවෙන ක්‍රීඩාලෝලීන් ඇතුළු සහෘදයන් සාක්ෂි දරනු ඇත.

# වේදිකාවේ රඟපෑ...

☞ 21 වෙනි පිටුවෙන්.....

"කවුද?"

"රෝහණ වීරසිංහ."

සුනිලුන්ගේ යෝජනාවට නිහාල්සිංහයන් එකඟ විය. රෝහණ දුටු නිහාල්සිංහයන් යෝජනාවක් ගෙනාවේය.

"රෝහණ, ඔයා සංගීත අධ්‍යක්ෂණය කරන ගමන්ම 'රේඛා' ටෙලිනාට්‍යයේ රඟපාන්න."

"අපෝ... මට වඩා ගැලපෙන කෙනෙක් ඉන්නවා, ලක්ෂ්මන් විජේසේකර කියලා. එයාට රඟපාන්නත් පුළුවන්, ගායනයත් පුළුවන්."

'රේඛා' ටෙලිනාට්‍යයේ ප්‍රධාන චරිතයට නිහාල්සිංහයන් ප්‍රධාන චරිතයට, චන්ද්‍රලේඛා පෙරේරාව තෝරාගෙන තිබුණි. ලක්ෂ්මන්ව 'රේඛා' ටෙලි නාට්‍යයේ ප්‍රධාන චරිතයට තෝරා ගත්තද ඔහුගේ හිතට හරි නැත.

"සර්, මේක බැරෑරුම් චරිතයක්. වෙන කෙනෙකු මේකට තෝරා ගන්න. මගේ හිතට හරි නෑ."

"තමුසෙට හරි නැති වුණාට මට හරිනේ. මම කියන විදියට ඉන්නවා. තමුසෙ හොඳටම හොඳයි."

ලක්ෂ්මන් හා චන්ද්‍රලේඛා ප්‍රධාන චරිත රඟපෑ අතර ඔවුන් ගැයූ මේ ගීතය රෝහණ තනු නිර්මාණය කළ අතර සුනිලුන් ගේය පද රචනා කර තිබූ අතර මේ නිර්මාණ සම්මානවලින් පිදුම් ලැබූහ.

"දැල් වූ පහන් දැල්වී තිබේවා
සුන් වූ පැතුම් දලුලා වැඩේවා
ළංවූ ළවන් හමුවී පිපේවා
වෙන්වූ නුවන් කඳුළින් මිදේවා
විරහී හදින් ගලනා දුක් වේදනාවන්
සිහිලැල් පවන් රැල්ලකින් සංසිඳේවා
නොබිඳී නිර්මල ප්‍රාර්ථනාවන්
පෙම්වත් ලොවක් අරුණ අහසේ දිසේවා..."

'ගංගා නිශ්ශංක' ටෙලිනාට්‍යයේ ලක්ෂ්මන් හා සමීතා මුදුන්කොටුව ගැයූ "සිනා පිපෙනා මේ වසන්තය, නෙළා දෝතින් මලක් සේ සිනාසී..." ගීතයේ රචනය කුමාරදාස සපුතන්ත්‍රි ගෙනි. මෙහි සංගීත නිර්මාණය රෝහණ වීරසිංහ ගෙනි. මේ ටෙලි නාට්‍යයේ නිශ්ශංක ලෙස ලක්ෂ්මන් ද, ගංගා ලෙස චම්පා ශ්‍රියානිය. චන්ද්‍රරත්න මාපිටිගමගේ අධ්‍යක්ෂණය කළ 'ඉර පායා' ටෙලි නාට්‍යයේ සමිතා සමඟ ගැයූ "ඉර පායා ඉර පායා" ගීතයද අතිශයින්ම ජනප්‍රිය විය.

ටෙලි නාට්‍ය අධ්‍යක්ෂණයට ඔහු දැක්වූ ප්‍රතිභාව වඩාත් කැපී පෙනුණේ 'විලම්බීත' නම් ටී.බී. ඉලංගරත්න මහතාගේ නවකතාව අපූරුවට පුංචි තිරයට නැංවීමෙනි. පී.යූ.ඩී. පෙරේරාගේ 'සින්ඩරැල්ලාගේ සෙරෙප්පුව', 'සුදු ඇතාගේ කතාව' චිත්‍රපටවලද සුසීමා දමයන්තිගේ කෙටි චිත්‍රපටයේද, ටී.ජී. සුසිරන් ද සිල්වාගේ 'මිස් ජෙනිසන්' චිත්‍රපටයේද 'බුමුතුරුණු', 'අත්ත බිංදයී', 'හිමි අහිමි', 'මවකගේ ගීතය' ටෙලි නාට්‍යවලද ඔහු සංගීත අධ්‍යක්ෂණය කළේය. වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් රැසක් අධ්‍යක්ෂණය කළ ලක්ෂ්මන්ගේ පසුබිමේ සිටියේ 'ටෙලිස්ටාර්' අධිපති බන්දුල වීරක්කොඩිය. ලක්ෂමන්ට ගීත ලියූවන් අතර බුද්ධදාස ගලප්පත්ති, කපිල කුමාර කාලිංග, යමුනා මාලිනි පෙරේරා ද වෙති.

ලක්ෂ්මන්ට අනාගත බිරිය හමුවුන්නේ දයානන්ද ගුණවර්ධනගේ 'බක්මහ අකුණු' වේදිකා නාට්‍යයේ ඔහු වාදක මණ්ඩලයේ ගිටාර් වාදකයකු ලෙසද, රෝහණ වීරසිංහ සිතාර් වාදකයකු ලෙස සිටි අවදියේ දීය. ලක්ෂ්මන්ගේ නෙත නාට්‍යයේ රඟපෑ සම්මානනීය නිළි චන්ද්‍රා කළුආරච්චිගේ නෙත හමුවූහ. 1975 වසරේ මේ දෙදෙනා විවාහ වූහ. ඔවුන්ට දරුවන් දෙදෙනෙකි. දියණිය අමා විජේසේකර සම්මානනීය රංග ශිල්පිනියකි. ඇය විවාහවී සිටින්නේ ප්‍රවීණ කලා විචාරක (අයි.ටී.එන්. නාලිකාවේ හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ) විමල් කැටපේ ආරච්චි සමඟය. පුතා විහඟ 'ඉවෙන්ට් මැනේජ්මන්ට්' ආයතනය පවත්වාගෙන යයි.

ඉහවහා ගිය මානව දයාවෙන් යුතු ලක්ෂ්මන් තම ආදරණීය බිරිය චන්ද්‍රා කළුආරච්චි මිය යනතුරුම සමීපව සිට උපස්ථාන කළ බව රහසක් නොවේ. ලක්ෂ්මන්ගේ අභාවයෙන් පසු සමාජ මාධ්‍යයක ඔහු ගැන මාධ්‍යවේදීයකු ලියූ මේ සටහනෙන් මේ ලිපිය අවසන් කරමු.

"ඔහු තම දියණියට හා පුත්‍රයාට පෑ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා ඈ සතර බ්‍රහ්ම විහරණ මට මෙන්ම සෙසු දූ දරුවන්ටත් එක ලෙස පෑ බව සියලු දූ දරුවන් සාක්ෂි දරනු ඇත. වසර 50 කට ආසන්න ඔහුගේ සුන්දර මානව හිතවාදී කලා ජීවිතය තුළ ඔහු කාට හෝ කුහකකමක්, කප්පාදුවක්, කකුල් මාට්ටු දැමීමක් සිදුකර ඇත්නම් මා හට පෙන්වා දෙන ලෙස මම ඕනෑම කෙනෙකුට අභියෝග කරමි. අද ජීවත්වන සමාජයේ මිනිසකු ගැන විශේෂයෙන් කලාකරුවකු ගැන මෙවැනි සහතිකයක් දිය හැකි වනුයේ ඉතා අල්ප ප්‍රමාණයකට බව බුද්ධිමත්හු වටහා ගනිති."

ලක්ෂ්මන්ට මීට වඩා වෙන උපහාරයක් කුමටද?